## 378 සිඹිමුව ඔබෙ සිරි පා කමලා

සිඹිමුව ඔබෙ සිරි පා කමලා
බඳිමුව ඔබෙ ගෙල දෑත වෙලා
වඩිමුව කැකුළු නෙලා පුදලා
ඇති විලේ කැලේ පිපිලා

අප පෙම්බරියේ කුමරිය මරියේ
නොමඳින සිරියෙන් ඔබ පිරියේ
ඔබෙ උයනේ අපි කොඳ කැකුලු
මවෙ අපි සැම ඔබේ ගෙලේ පබලු

ඔබෙ සළු පොට ගෙන අප ඔතලා
දෙව් පුතනුට අප පුද කරලා
ඔබ ළඟ අසුනක නංවාලා
සුර පුරේ දමා මාලා